**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - 2013**

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්, විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට පටහැනි වීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව ආදායමින් වියදම් හිලව් නොකළ යුතු වුවද රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබූ ණය මුදලකට අදාලව සමාලෝචිත වර්ෂයේ ගෙවූ පොළී රු.491,738 ක් ආයෝජන ආදායමට එරෙහිව කපා හැර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විශ්වවිද්‍යාලය සතු අක්කර 220 කට අධික ඉඩම්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාකරන ස්වයං උත්පාදන ව්‍යාපෘති වෙත ලැබෙන මුදල් ආයෝජනය කිරීමෙන් ලද රු.4,518,078 ක් විශ්වවිද්‍යාලයේ ආයෝජන ආදායම් ලෙස හඳුනාගැනීම වෙනුවට එම ව්‍යාපෘති ගිණුම්වලට බැරකර තිබුණි.

(ඇ) පර්යේෂණ වියදම් වෙනුවෙන් අයවැය මගින් වෙන්කරන සම්පූර්ණ මුදල වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ සත්‍ය පර්යේෂණ වියදම රු.4,183,432 ක් වුවත් වෙන්කළ සම්පූර්ණ මුදල වූ රු.7,000,000 ක් වියදමක් ලෙස දක්වා තිබුණි. වර්ෂයක් පාසා මෙයින් වැයකර ඉතිරිවන මුදල පර්යේෂණ ප්‍රදාන අරමුදල් ගිණුමේ ශේෂය ලෙස ඉදිරියට ගෙනවිත් තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසානයට එම ශේෂය රු.11,467,078 ක් විය.

(ඈ) විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට අදාලව වැඩපූර්ව අත්තිකාරම් ලබා දී පසුව ගෙවීම් කරන ලද බිල්පත්වලින් අත්තිකාරම් නිරවුල් කර තිබුණද එය ජ'නල් සටහන් මගින් ගිණුම්වලට ගැලපීම් කර නොතිබීම හේතුවෙන් වැඩපූර්ව අත්තිකාරම් ගිණුම රු.2,065,676 ක් වැඩියෙන් හා කෙරීගෙන යන වැඩ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඉ) වත්කමක් පාවිච්චියට සුදුසු තත්ත්වයකට පත්කළ අවස්ථාවේ සිට එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමානුකූලව ක්ෂය කළයුතු නමුත්, රු.47,132,633 ක පිරිවැයකින් ඉදිකරන ලද ජල ව්‍යාපෘතිය සඳහා ඉකුත් වර්ෂ 02 වෙනුවෙන් රු.4,713,263 ක් ක්ෂය ප්‍රතිපාදන සිදු කර නොතිබුණි.

2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

(අ) මහාචාර්යවරයෙකුගේ නමින් ඇති පරිත්‍යාග අරමුදල් (Endowment Fund) ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල උපලේඛනයේ රු.52,625 ක් ලෙස සටහන් කර තිබුණු නමුත් එය ලෙජර් ගිණුමේ රු.102,625 ලෙස දක්වා තිබීමෙන් රු. 50,000 ක වෙනසක් නිරීක්ෂනය විය.

(ආ) පෞද්ගලික ලිපිගොනු අනුව විශ්වවිද්‍යාලයේ ගිවිසුම් කඩකරන ලද ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අය විය යුතු මුදල රු.1,354,676 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු. 1,538,421 ක් ලෙස දක්වා තිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම පීඨයට අයත් රු. 82,270 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පශු සම්පත්වල වටිනාකම හා භෞතික පැවැත්ම සනාථ කිරීමට අවශ්‍ය ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයේ අධ්‍යයන කාර්යය මණ්ඩල සඳහා ගෙවූ රු.26,944,235 ක් වූ පර්යේෂණ දීමනාවලට සම්බන්ධ විගණන විමසුමකට පිළිතුරු ලබාදී නොතිබුණු අතර ගෙවීම්වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

2.3 ලැබිය යුතු ගිණුම්

වර්ෂ 01 සිට වර්ෂ 06 දක්වා කාලයක සිට නොපියවා ඇති එකතු වටිනාකම රු.75,000 ක් වූ පර්යේෂණ අත්තිකාරම් ශේෂ 02 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයවී නොතිබුණි.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ පරිගණක ගත කරනලද ස්ථාවර වත්කම් ලේඛනය 2010 දෙසැම්බර් 31 දින දක්වා පමණක් යාවත්කාලීන කර තිබීම හේතුවෙන් 2011 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා ගිණුම් වලට ඇතුළත් කර තිබූ රු.1,804,302,726 ක් වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 15 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | (i) මුදල් රෙගුලාසි 772(1) | 2013 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මගින් හඳුනාගන්නා ලද විෂයයන් 76 කට අයත් භාණ්ඩ අයිතම 1230 ක් සුදුස්සක් කොට බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 1645 (ආ) සහ 1646 | සමාලෝචිත වර්ෂයට අදාල වාහන ධාවන සටහන් හා වාහන ලොග් සටහන් පොත් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණු ඉන්ධන වියදමෙන් රු.7,478,277ක් හා වාහන නඩත්තු වියදම රු. 4,436,025 ක් සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. |

2.5 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපකුලපති නිල නිවස වටා තාප්පයක් ඉදිකිරීම සඳහා පිළියෙල කළ විශ්වවිද්‍යාලයේ ඇස්තමේන්තු වටිනාකම රු.8,006,455 ක් හා එම ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලැබී තිබූ සුදුසුකම්ලත් අවම මිල ගණන් රු.8,013,185 ක් වුවද ඇස්තමේන්තු මිල හා අවම මිල ගණන් නොසලකා රු.9,630,623 ක් මිල ගණන් ඉදිරිපත්කළ වෙනත් කොන්ත්‍රාත්කරුවකුට ඉදිකිරීම් ව්‍යාපෘතිය පිරිනැමීම හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදලට රු.1,617,438 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සතුව ඉංජිනේරුවරු දෙදෙනෙකු ඇතුළුව ඉංජිනේරු කාර්ය මණ්ඩලයකින් සමන්විත ඉංජිනේරු අංශයක් තිබියදී උපකුලපති නිල නිවස වටා තාප්පයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ උපදේශන සේවා ලබාගැනීමට ඇස්තමේන්තු අගයෙන් සියයට 5.5 ක් උපදේශන ගාස්තු ගෙවීමට එකඟ වී තාප්පය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ උපදේශක සේවා ලබාගැනීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට එම කටයුතු පවරා තිබුණි.

(ඇ) උපකුලපති නිල නිවස වටා තාප්පයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාල කොන්ත්‍රාත් ලියකියවිලිවල ඇතුළත් සම්මත ලංසු ආකෘතිපත්‍රවල දක්වා ඇති පරිදි වැඩ නිමකිරීමට ප්‍රමාද වන දිනක් සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 0.05 ක් සහ උපරිමය සියයට 10 ක් වන පරිදි ප්‍රමාද ගාස්තු අයකළ යුතු වුවද ගිවිසුම් ගත වැඩ නිමකළයුතු දින සිට 2014 ඔක්තෝබර් 21 දින වන විට ප්‍රමාදය දින 200 ක් ඉක්මවා ඇති බැවින් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 ක් එනම් රු.963,062 ක් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවලින් රු.18,154,195 ක ඌනතාවයක් ඇති වී තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.24,064,637 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,910,442 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ බාහිර පාඨමාලාවල ආදායම රු.36,970,653 කින් වැඩිවීම වර්ධනයට ප්‍රධාන වශයෙන් ප්‍රධාන හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යසාධනය පහත පරිදි වේ.

4.1 (අ) විභාග ප්‍රතිඵල

2013 වර්ෂයේදී පැවැත් වූ අවසන් වසර විභාගය හා උපාධිය සමත්වීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | ව්‍යවහාරික විද්‍යා පීඨය | කෘෂිකර්ම විද්‍යා පීඨය | කළමනා කරණ අධ්‍යයන විද්‍යා පීඨය | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් වසර විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 204 | 88 | 344 | 464 | 230 | 1330 |
| පන්ති සාමාර්ථ සහිතව සමත් සංඛ්‍යාව | 74 | 61 | 32 | 409 | 69 | 645 |
| සාමාන්‍ය සමත් සංඛ්‍යාව | 103 | 20 | 233 | 29 | 130 | 515 |
| මුළු සමත් සංඛ්‍යාව | 177 | 81 | 265 | 438 | 199 | 1112 |
| අසමත් සංඛ්‍යාව | 27 | 07 | 79 | 26 | 31 | 170 |
| විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් උපාධිය අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය | 13.23 | 7.9 | 22.9 | 5.6 | 13 | 12.5 |

i) සමාලෝචිත වර්ෂය තුළදී පීඨ 05 ක අවසන් වසර විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 1330ක් වූ අතර එයින් ශිෂ්‍යයන් 170 දෙනෙකු විභාගයෙන් අසමත්වී තිබූ අතර එය විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 12.7 ක් විය.

ii) සමාලෝචිත වර්ෂයේ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ සහ කළමනාකරණ අධ්‍යයන පීඨයට අදාල උපාධි පාඨමාලාවන්හි සමාසික විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීම මාස 05 සිට මාස 10 දක්වා කාල ප්‍රමාදයක් සහිතව සිදුවී තිබුණි.

iii) ව්‍යවහාරික විද්‍යා පීඨයේ සහ කෘෂිකර්ම පියයේ සමාසික විභාග පැවැත්වීම හා ඒවායේ ප්‍රතිඵල නිකුත් කිරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම විභාගවල ප්‍රතිඵල නිකුත්කිරීමේ කාර්යක්ෂමතාව පිළිබඳ පරික්ෂා කිරීමට නොහැකි විය.

iii) වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨයේ සියළු විභාගවලට අදාල ප්‍රතිඵල දින 11ත් දින 82ත් කාලයක් අතර නිකුත්කර තිබුණි.

(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

සමාලෝචිත වර්ෂයේදී එක් එක් පීඨයේ මුළු පුනරාවර්තන පිරිවැය හා ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | කෘෂිකර්ම පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | කළමනාකරණ පීඨය | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු.000) | 83,772,217 | 93,057,757 | 73,651.200 | 103,993,620 | 130,270,559 | 484,745,353 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 427 | 862 | 1292 | 1731 | 1090 | 5,402 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු. 000) | 196,188 | 107,956 | 57,006 | 60,077 | 119,514 | 89,734 |

අනෙකුත් පීඨයන්ට සාපේක්ෂව කෘෂිකර්ම පීඨය සඳහා අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීම, ඒක ශිෂ්‍ය පිරිවැය ඉහළ යෑමට හේතුවී තිබුණි.

(ඇ) දේශන පැවැත්වීමේ ප්‍රගතිය

(i) විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයට අදාලව සිදුකරනු ලබන දේශන පිළිබඳව මෙන්ම අධ්‍යන කාර්යය මණ්ඩලයේ ප්‍රගතිය මැනීම සඳහාද ඇති එකම ලිඛිත සාක්ෂිය වූයේ එක් එක් දේශනයට අදාලව ශිෂ්‍යන්ගේ පැමිණීම ලකුණු කරන ලද අත්සන් පත්‍රිකාව පමණක් වන අතර එය අංශ ප්‍රධානීන්ට හෝ පීඨාධිපති වරුන්ට එක් එක් පාඨමාලාවේ හෝ විෂයන්ට අදාලව දේශකවරුන්ගේ සමාසික ප්‍රගතිය අධීක්ෂණය කිරීමට ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් නොවන බව නිරීක්ෂණය විය. ඒ අනුව අංශ ප්‍රධානීන් හෝ පීඨාධිපතිවරුන් විසින් අධ්‍යයන කාර්යසාධනය ප්‍රමාණවත් ලෙස ඇගැයීම් කළ බවට තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ii) 2013 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුළ අධ්‍යයන කාර්යසාධනය පිළිබඳව භෞතික ඉලක්ක දක්වා නොතිබූ බැවින් වර්ෂ අවසානයට ඉලක්ක සපුරා ගැනිම පිළිබඳ විගණනයේදි ඇගැයීමට නොහැකි විය.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) විශ්වවිද්‍යාලය සතු අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්වයක වූ වෑන් රථයක් අළුත්වැඩියා කිරීම් නොකර සමාලෝචිත වර්ෂය තුළ කුළී පදනම මත ලබාගත් වාහන වෙනුවෙන් රු.873,168 ක් යොදා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පිහිටා ඇති පොලිස් නිල නිවාස 40 ක් හා එම ඉඩම විශ්වවිද්‍යාලයට පවරාගැනීමට භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති රු. මිලියන 18 ක මුදල හා ඊට අදාලව ලද පොළිය සමඟ එකතුව වූ රු. මිලියන 29 ක ප්‍රතිපාදන තිබියදී එම මුදල් ගෙවා පොලිස් නිවාස පවරා ගැනීමට කටයුතු නොකර ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා පෞද්ගලික නිවාස 48 ක් කුළී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාල අරමුදලින් සමාලෝචිත වර්ෂයේදි රු.21,318,000 ක මුදලක් නිවාස කුළී සඳහා ගෙවා තිබුණි.

(ඇ) ආපසු භාර නොදුන් පුස්තකාල පොත්

(i) ප්‍රධාන පුස්තකාලයෙන් රජරට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 56 දෙනෙකු විසින් ලබාගත් පොත් 167 ක් නියමිත දිනය ඉක්මවා මාස 06 සිට වසර 07 ක කාලයක් ගතවී ඇතත් ආපසු බාර දී නොතිබුණි.

(ii) කෘෂිකර්ම පීඨ පුස්තකාලයෙන් ආචාර්යවරු 04 දෙනෙකු විසින් ලබාගත් පොත් 11 ක් 2013 දෙසැම්බර් 31 දිනට මාස 04 සිට වසර 05 දක්වා කාලයක් ගත වී ඇතත්, ආපසු භාරදී නොතිබුණි.

4.3 නිෂ්කාර්ය වත්කම්

රාජ්‍ය බැංකු ශාඛාවක පවත්වාගෙන යන ගිණුමක රු.906,230 ක ශේෂයක් 2012 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි.

4.4 ප්‍රමාද වූ ව්‍යාපෘති

කෘෂිකර්ම පීඨය පුළුල් කිරීමේ කටයුතු සඳහා අක්කර 15 ක පමණ ඉඩමක් අත්පත් කරගැනීම වෙනුවෙන් 2011 වර්ෂයේදී මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශීය ලේකම් වෙත රු. 7,200,000 ක මුදලක් තැන්පත් කර තිබූ නමුත්, 2014 ජුනි මාසය වන විටත් අදාල පවරා ගැනීම සම්පූර්ණ කර නොතිබුණි.

4.5 කාර්යය මණ්ඩල පරිපාලනය

(අ) සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තනතුරු 118 ක්ද අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 72 ක් ද පුරප්පාඩු පැවතුණි.

(ආ) අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පැවතියද ඇතැම් විෂයයන් සඳහා අතිරික්තව කථිකාචාර්යවරුන් 14 ක් සිටින අතර කථිකාචාර්යවරු 35 දෙනෙකු දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව සඳහා අධ්‍යයන නිවාඩුද කථිකාචාර්යවරු දෙදෙනෙකු සප්ත වාර්ෂික නිවාඩු ලබා සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයෙන් බැහැර වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කටයුතු සඳහා යොදවා ගැනීමට නොහැකි වූ අධ්‍යයන කාර්යය මණ්ඩල සංඛ්‍යාව 155 ක් වූ අතර, එය අනුමත කාර්යය මණ්ඩලයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 52 ක් විය. පවතින අධික පුරප්පාඩු හේතුවෙන් බාහිර කථිකාචාර්යවරු 179 දෙනෙකු සඳහා දේශන ගාස්තු වශයෙන් රු.12,832,113 ක් ගෙවා එම සේවාව ලබා ගෙන තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ තථ්‍ය හා අනුමත කාර්යය මණ්ඩල ලේඛනයට අනුව 2013 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ මාණ්ඩලික නොවන තනතුරුවල පුරප්පාඩු 64 ක් පමණක් පැවති අතර එම පුරප්පාඩු නොසලකා ශ්‍රම සැපයුම් අංශය මඟින් සපයාගත් ශ්‍රම සැපයුම් සේවා සඳහා පුහුණු හා නුපුහුණු කම්කරුවන් හා පරිගණක යෙදවුම් සහකාර ලෙස පුද්ගලයන් 109 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී රු.15,143,478 ක් ගෙවීම් කර තිබුණු අතර මේ සඳහා මහා භාණ්ඩාගාරයෙන්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් විධිමත් අනුමැතියක් ලබාගෙන තිබූ බවට සාක්ෂි නොතිබුණි.

4.6 උපාධි පාඨමාලා රැකියා වෙළඳපොලට ඉලක්ක ගතව සංශෝධනය නොවීම

විශ්වවිද්‍යාලයේ වර්ෂ 06 සිට වර්ෂ 17 දක්වා කාලයක් තුළ උපාධි පාඨමාලා 13 ක විෂය නිර්දේශයන් සංශෝධනය කර නොතිබුණි.

4.7 ආර්ථික නොවූ ගණුදෙනු

(අ) විශ්වවිද්‍යාලය විසින් 2013 වර්ෂය තුළ රු. 9,933,284 ක මුදලක් කොන්ත්‍රාත් සමාගමකට ගෙවා උද්‍යාන නඩත්තු සේවාව ලබාගෙන තිබියදී ශ්‍රම සැපයුම් සේවාව මඟින් ලබාගත් ශ්‍රමිකයින් 15 දෙනෙකුද උද්‍යාන නඩත්තු සඳහා යොදවා සමාලෝචිත වර්ෂයයේදී රු. 631,900 ක් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා බදු ගැනීමට යෝජිත නිවාස ගොඩනැඟිලි වෙනුවෙන් 2011,2012 සහ 2013 වර්ෂයන්ට අදාල වන පරිදි තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු වාර්තා නිකුත් කර ඇතත්, එම මාසික කුළී ප්‍රමාණයන් ඉක්මවා සියයට 200 දක්වා ඉහළ මිලකට නේවාසිකාගාර 14 ක් කුළී පදනමට ලබාගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 1,296,000 ක මුදලක් වැය කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය විසින් 2013 වර්ෂය වෙනුවෙන් ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා කුළී පදනම මත ලබාගත් නිවාස 34 ක මාසික කුළිය තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කර ගැනීමකින් තොරව නිවාස හිමිකරුවන් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් පදනම් කරගෙන කුළී ගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු.16,296,000 ක් වාර්ෂික නිවාස කුළී ලෙස විශ්වවිද්‍යාල අරමුදලින් දරා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 ක්‍රියාකාරි සැලැස්ම

2013 වර්ෂය වෙනුවෙන් සකස්කර තිබූ ක්‍රියාකාරි සැලැස්ම තුළ ලඟාකරගත යුතු භෞතික ඉලක්ක නිශ්චිතව දක්වා නොතිබීම හේතුවෙන් එම ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව විශ්වවිද්‍යාල කටයුතු මෙහෙයවා තිබුණේද යන්න පරීක්ෂා කිරීමට නොහැකි විය.

5.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකය 2002 වර්ෂයේදී ස්ථාපිත කර තිබුණු අතර 2002 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා විශ්වවිද්‍යාලයේ කටයුතු විශාල ලෙස පුළුල් වී තිබූ නමුත් එම කටයුතු සියල්ල ආවරණය කළ හැකි වන සේ අභ්‍යන්තර විගණන කාර්යය මණ්ඩලය සංශෝධනය කර නොතිබුණි. සහකාර අභ්‍යන්තර විගණක හා පරිගණක යෙදවුම් සහකාරවරයෙකු ඇතුළු 03 දෙනෙකු අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයට ඇතුළත් වී තිබුණද අධ්‍යයන කාර්යසාධනය පිළිබඳව අභ්‍යන්තර විගණන කටයුතු ඉටුකර නොතිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 06 ක ඇස්තමේන්තුගත ආදායම සියයට 244 ක ඉක්මවීමක්ද ආදායම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත ආදායම සියයට 58 ක ලඟා නොවීමක්ද නිරීක්ෂණය වූ අතර වැය විෂයයන් 19 ක වියදම ඉක්මවීම සියයට 91 ක්ද වැය විෂයයන් 20 ක වෙන්කළ ප්‍රතිපාදන ඉතිරිය සියයට 48 ක් විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන
----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර උපකුලපතිවරයා වෙත යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) මානව සම්පත් කළමනාකරණය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඈ) අයවැය පාලනය
(ඉ) වාහන පාලනය
(ඊ) ගිවිසුම්ගත සේවා හා කොන්ත්‍රාත් පරිපාලනය